# ICCP/SL/OP/224

## දුරකථන අවභාවිතය නිසා සිදුවන ළමා අපයෝජන පිළිබඳ දාර්ශනික අධ්‍යයනයක් : බුලත්කොහුපිටිය ප්‍රදේශයේ පොලිස් පැමිණිලි ඇසුරෙන්

ලියනආරච්චි එල්.ඒ.ඒ.එස්

*දර්ශන අධ්‍යයන අංශය, සමාජයීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*
ashiniliyanaarachchi9@gmail.com

**පසුබිම:** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අනුව, වයස අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයෙකුම ළමයා යනුවෙන් හඳුන්වයි. කුඩා කල පටන් සිය මාපිය රැකවරණය යටතේ හැදී වැඩෙන දරුවා ක්‍රමයෙන් සමාජයට නිරාවරණය වීමත් සමඟ ජංගම දුරකථනය හා සබැඳි විවිධ ක්‍රියාකාරකම් වෙත යොමු වේ. එය වර්තමානයේ පුළුල් ගැටලුවක් බවට පත්ව ඇත්තේ දිනෙන් දින මෙම ජංගම දුරකථන අවභාවිතය හරහා සිදුවන්නා වූ ළමා අපයෝජන ප්‍රතිශතය ඉහළ යාම හේතුවෙනි.

**ක්‍රමවේදය:** මෙම අධ්‍යයනයේ දී මිශ්‍ර ක්‍රමවේදය යොදා ගන්නා ලදී. ඒ අනුව බුලත්කොහුපිටිය පොලිස් බල ප්‍රදේශයේ තෝරාගත් ග්‍රාමනිළධාරී වසම් කිහිපයක (2023,2024)වර්ෂයන්වල දුරකථන අවභාවිතය හේතුවෙන් සිදු වූ ළමා අපයෝජන සම්බන්ධයෙන් වාර්තා වූ පැමිණිලි 25ක් අහඹු නියැදීම යටතේ ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙසත්, සම්මුඛ සාකච්ඡා ප්‍රාථමික දත්ත මූලාශ්‍රය ලෙසත් භාවිත කරන ලදී.

**ප්‍රතිඵල:** රැස්කර ගත් දත්ත හා තොරතුරු අනුව වයස අවුරුදු 14-17 (42%) අතර වයස් කාණ්ඩවල පසුවන බාලවයස්කාර දරුවන් දුරකථන අවභාවිතය හේතුවෙන් විවිධාකාර අපයෝජනයන්ට ලක් ව ඇත. තවද ජංගම දුරකථනය අනිසි ලෙස භාවිත කරමින් අතෘප්තිකර ලිංගික ආශාවන් ඉටු කරගැනීම, ලිංගික අධ්‍යාපනය පිළිබඳ නිසි දැනුමක් නොමැතිකම, සිය හුදෙකලාභාවය නැති කර ගැනීමේ අරමුණින් ඇති කරගන්නා ප්‍රේම සබඳතා හා නවීන තාක්ෂණය පිළිබඳ නොදැනුවත්භාවය ආදී විවිධ සමාජ, සංස්කෘතික හා මනෝවිද්‍යාත්මක සාධක රාශියක් මෙවැනි ළමා අපයෝජන බහුල වීමට බලපා ඇති බවත් අනාවරණය විය. මෙලෙස සිදුවන්නා වූ ළමා අපයෝජනයන්හි අනිසි ප්‍රතිවිපාකයන් ලෙස අධ්‍යාපනික කටයුතු අඩාළ කර ගැනීම,ළමා මව්වරු බිහිවීම,මානසික අවපීඩනයට ලක්වීම වැනි වාතාවරණයන් අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත ව පැන නැගී ඇති බවත් ගම්‍ය විය.

**නිගමනය:** මෙලෙස සිදුවන්නා වූ ළමා අපයෝජනයන් ඉහළ යාම කෙරෙහි පවුල් පරිසරයේ ස්වභාවය, සමාජානුයෝජනයේ පවත්නා දුර්වලතාවන්, පුද්ගල මනෝභාවයන් මෙන් ම සමාජ සංස්කෘතික වටපිටාව යනාදිය බලපාන බැව් තහවුරු විය. එබැවින් මෙම පර්යේෂණය තුළින් දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කරන පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

**මුඛ්‍ය පද :** දුරකථන අවභාවිතය, ලිංගික අධ්‍යාපනය, සමාජානුයෝජනය, ළමා අපයෝජන